රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.

இணைந்த சேவைகள் பிரிவு
சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.

Combined Services Division
Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය
தொலைபேசி: **011- 2694560**
Telephone

ෆැක්ස්
தொலைநகல்: **011- 2692254**
Fax

ඊ- මේල්
மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk**
E-mail

වෙබ් අඩවිය
இணைத்தளம்: **www.pubad.gov.lk**
Web Site

මගේ අංකය
எனது இல
My No
R/10/2026

ඔබේ අංකය
உமது இல
Your No

දිනය
திகதி:
Date
2026.11. 23

ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය -2026
පත්වීම් ප්‍රදානය සහ පුහුණු වැඩමුළුව

විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 මැයි මස 17 වන දින පවත්වන ලද උක්ත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව, 2026 සැප්තැම්බර් මස 05, 06, 10 සහ 11 දිනවල පැවති සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ හා වෘත්තීය පරීක්ෂණයේ ප්‍රතිඵල මත **2026.12.15** දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒකාබද්ධ රියදුරු සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් සඳහා සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්ගේ නාමලේඛනය මේ සමග පළ කර ඇත.

02. එම අයදුම්කරුවන් සඳහා වන පත්වීම් ලිපි ප්‍රදානය සහ රාජ්‍ය නිලධාරියෙකු ලෙස හා ඒකාබද්ධ රියදුරු සේවයේ පත්වීම්ලාභී නිලධාරියෙකු වශයෙන් පැවරෙන රාජකාරි සහ අපේක්ෂා කරන කාර්යයන් පිළිබඳව වන පුහුණු වැඩමුළුවක් **2026 දෙසැම්බර් මස 05** වැනි දින **පෙ.ව. 8.30 සිට ප.ව. 2.00 දක්වා නො. 150, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03** පිහිටි අරලියගහ මන්දිරයේ දී පවත්වනු ලබන අතර ඒ සඳහා වන කැඳවීම් ලිපි තැපැල් මගින් සුදුසුකම් ලද සියලු අයදුම්කරුවන් වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

03. පත්වීම් ප්‍රදානය සහ පුහුණු වැඩමුළුව සඳහා පැමිණීමට උපදෙස්

i. සියලු පත්වීම්ලාභීන් **පෙරවරු 8.00** වන විට ශාලාවේ අසුන්ගෙන සිටිය යුතු වේ.

ii. සියලු පත්වීම්ලාභීන් සිය අනන්‍යතාව තහවුරු කිරීම සඳහා මෙම කැඳවීම් ලිපිය සහ ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය අනිවාර්යයෙන්ම රැගෙන ඒ යුතු වේ.

iii. පරිශ්‍රය තුළට ඇතුළු කරගනු ලබන්නේ **අදාළ පත්වීම්ලාභියා පමණක්** වන බව සැලකිය යුතු වේ. අමතරව පැමිණෙන පිරිසට පහසුකම් සැලසීමේ හැකියාවක් නොමැති බව ද සැලකුව මැනවි.

iv. මෙම අවස්ථාවට සහභාගි වන පත්වීම්ලාභීන් කමිසය, කලිසම හෝ ජාතික ඇඳුම වශයෙන් ගැළපෙන සුදුසු චාම් ඇඳුමකින් සැරසී පැමිණිය යුතු වේ.

v. ගමන් මලු සහ ඉලෙක්ට්‍රොනික් උපකරණ ශාලා පරිශ්‍රය තුළට රැගෙන යාමට අවසර ලබා නොදෙන බැවින් එවැනි දෑ රැගෙන ඒමෙන් වළකින ලෙසට දැනුම්වත් කරනු ලැබේ.

එන්.යූ. නිෂාන් මෙන්ඩිස්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්